සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**12 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)

| | |
|---|---|
| **ශෛවනෙරි I, II**<br>சைவநெறி I, II<br>Saivanery I, II | **පැය තුනයි**<br>மூன்று மணித்தியாலம்<br>*Three hours* |

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## ශෛවනෙරි I

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන වරණවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** බොරු සාක්ෂි දුන් බැවින් උමා දේවියගේ ශාපයට ලක් වූ තිරුමාල් ශාපයෙන් මිදීමට සිදුකරන ලද උපවාසය වන්නේ,
(1) විනායග ෂෂ්ටි උපවාසයයි. (2) ඒකාදසි උපවාසයයි.
(3) කේදාරගෞරි උපවාසයයි. (4) වරලට්සුමි උපවාසයයි.

**2.** ඉතා පැරණි ඉන්දීය සංගීත ග්‍රන්ථයක් යැයි සැලකිය හැකි වේදය වන්නේ,
(1) ඍග් වේදයයි. (2) යජුර් වේදයයි. (3) සාම වේදයයි. (4) අදර්ව වේදයයි.

**3.** අර්ජුනන්ට, ක්‍රිෂ්ණ පරමාත්ම විසින් සිදු කරන ලද ඉගැන්වීම් ඇතුළත් වන්නේ,
(1) භගවත් ගීතාවෙහි ය. (2) රාමායණම්හි ය. (3) ධම්මපදම්හි ය. (4) මහාභාරතයෙහි ය.

**4.** කුමරකුරුපරර් තුමා සරස්වතී දේවියට ප්‍රශංසා ලෙස වන්දනා කරමින් ගායනා කරන ලද්දේ,
(1) සරස්වතී අන්දාති ය. (2) සහලකලාවල්ලි මාලෛ ය.
(3) අභිරාමි අන්දාති ය. (4) නවරාත්‍රී පාමාලෛ ය.

**5.** කෙනෙකුට 'සිවපුත්‍රන්' යන සුදුසුකම ලබා දිය හැකි තීට්චාව කුමක් ද?
(1) විශේෂ තීට්චෛ (2) නිර්වාණ තීට්චෛ
(3) සමය තීට්චෛ (4) සාදාර තීට්චෛ

**6.** එකොළොස්වැනි තිරුමුරෛවලට අයත් **නොවන්නේ,**
(1) පොන්වණ්ණත්තන්දාදි ය. (2) තිරුත්තොණ්ඩර් තිරුවන්දාදි ය.
(3) තිරුමුරුහාට්රුප්පඩෛ ය. (4) තිරුප්පල්ලාණ්ඩු ය.

**7.** "ඌරුණි නීර් නිරෛදෙට්ට්‍රෙ උලහවාම්..." යන්න ඇතුළත් ග්‍රන්ථය වන්නේ,
(1) තිරුමන්දිරම් ය. (2) තිරුක්කුරල් ය.
(3) මණිමේගලෛ ය. (4) සිලප්පතිකාරම් ය.

**8.** දේවාල පිළිවෙත්වලින් 'පෙරුඥ්චාන්ති' යැයි ප්‍රශංසා කරනු ලබන පිළිවෙත වන්නේ,
(1) කර්ෂණම් ය. (2) ප්‍රදිස්ටෛ ය.
(3) උත්සවම් ය. (4) ප්‍රායච්චිත්තම් ය.

**9.** ලන්දේසි හමුදාපතිවරයකුගේ බිරිඳගේ සහාය ඇතිව අලුතින් නිර්මාණය කරන ලද කෝවිල වන්නේ,
(1) පොන්නම්බලවානේච්චරම් දේවාලයයි. (2) නල්ලූර් කන්දසාමි දේවාලයයි.
(3) වණ්ණාර්පණ්ණෛ සිව දේවාලයයි. (4) නයිනෛ නාගපූසණි අම්මන් දේවාලයයි.

[දෙවැනි පිටුව බලන්න.

**10.** ග්‍රහලෝක නවය අතුරින් ඡායා ග්‍රහලෝක වන්නේ,
(1) ඉර සහ හඳ ය.
(2) අඟහරු සහ බුධ ය.
(3) බ්‍රහස්පති සහ සෙනසුරු ය.
(4) රාහු සහ කේතු ය.

**11.** දේවාලවල ප්‍රදිශ්ටා පිළිවෙත් ඉටු කිරීමට හිමිකම් ඇති පුද්ගලයා වන්නේ,
(1) දේවාලයේ පාලකයා වේ.
(2) භක්තිය සහ දැනුම යනාදී ආචාර ගුණධර්ම ඇති කෙනා වේ.
(3) දේවාලය නිර්මාණය කළ ස්තපදිය වේ.
(4) තිරුප්පදිහංගල් ගයන අය වේ.

**12.** තිරුඥානසම්බන්දර්තුමාගේ රෝගය සුව කරන ජීවසේවාව සම්බන්ධ තිරුමුරෙ ගීත වන්නේ,
(1) 'සෙය්යනේ තිරුවාලවායි','ඉඩරිනුම් තළරිනුම්' වේ.
(2) 'තුණිවළර් තින්ගල්','අව්විනෛක් කිව්විනෛ' වේ.
(3) 'අත්ති නාත්ති','මන්දිරමාවදු නීරු' වේ.
(4) 'වාළ්හ අන්දණර්','සඩෛයායෙනුමාල්' වේ.

**13.** ත්‍රිකරණංගල් වන්නේ,
(1) මැනම්, වාක්කු සහ කායම් ය.
(2) මැනම්, පුත්ති සහ සිත්තම් ය.
(3) මැනම්, සිත්තම් සහ කායම් ය.
(4) මැනම්, පුත්ති සහ අහංගාරම් ය.

**14.** අට්ටාංග යෝගක් කුරුගල් ඇතුළත් වන කාණ්ඩය තෝරන්න.
(1) කර්මම්, භක්ති, ඥානම්
(2) කර්මම්, ආසනම්, ප්‍රාණායාමම්
(3) තාරණෛ, තියානම්, ඥානම්
(4) ආසනම්, තියානම්, තාරණෛ

**15.** 'තොන්රු තොට්ටු වරුම් අරිවු' යන්නෙහි අර්ථය වන්නේ,
(1) වේද ය.
(2) ආගමම් ය.
(3) පුරාණම් ය.
(4) තේවාරම් ය.

**16.** සදුරංග ෂේත්‍රම් යැයි අගය කරනු ලබන දේවාලය වන්නේ,
(1) පොන්නාලෙ වරදරාජප් පෙරුමාල් දේවාලයයි.
(2) ඉණුවිල් කන්දසුවාමි දේවාලයයි.
(3) මණ්ඩූර් කන්දසුවාමි දේවාලයයි.
(4) වල්ලිපුර ආළ්වාර් දේවාලයයි.

**17.** අවමංගල පිළිවෙත් පමණක් ඇතුළත් වරණය වන්නේ,
(1) මංගලනාණ් පූට්ටුදල්, අන්දියේශ්ටි හා නාමකරණම් ය.
(2) මහාලය පට්චම්, තිවසම් හා අන්නප්ප්‍රාසනම් ය.
(3) තීවලම් වරුදල්, සපිණ්ඩිකරණම් හා මාසිහම් ය.
(4) අශ්ති සන්ජයනම්, සිරාත්තම් හා වීට්ටුක් කිරුත්තියම් ය.

**18.** මෙයිකණ්ඩ දේවර් හා සම්බන්ධ කාණ්ඩය වන්නේ,
(1) සහලාගම පණ්ඩිදර්, සිවඥානපෝදම් ය.
(2) සිවඥානපෝදම්, උණ්මෛ විලක්කම් ය.
(3) සුවේදනප් පෙරුමාල්, සිවඥානපෝදම් ය.
(4) සහලාගම පණ්ඩිදර්, සිවඥානසිත්තියාර් ය.

**19.** අරුමුග නාවලර්තුමාගේ ආචාර්යවරුන් වන්නේ,
(1) සෙන්දිනාදෛයර් හා සේනාදිරාය මුදලියාර් ය.
(2) කෛලාසප්පිල්ලෛ හා නල්ලූර් සරවණමුත්තු උබාත්තියායර් ය.
(3) සේනාදිරාය මුදලියාර් හා නල්ලූර් සරවණමුත්තු උබාත්තියායර් ය.
(4) කෛලාසප්පිල්ලෛ හා පාර්සිවල් පියතුමා ය.

**20.** සෛවපරිපාලන සභාව හා සම්බන්ධ කාණ්ඩය කුමක් ද?
(1) නාවලර් ආච්චිරමම්, ඉන්දු සාදනම් හා පුණ්ණිය නාච්චියාර් මඩම
(2) සෛවාසිරිය කලාසාලෛ, තිරුක්කේදීච්චරම් හා යාපනයේ හින්දු විද්‍යාලය
(3) ආගමික විභාග, කාර්තිහෙ මඩම පාලනය කිරීම හා මාදගල් විග්නේශ්වරා විද්‍යාලය
(4) වෘත්තිය පුහුණු පාසල්, ඉන්දු සාදනම් හා සෛවාසිරිය කලාසාලෛ

**21.** තිරුවාසගම්වල ඇතුළත් ගීතිකා පමණක් අඩංගු කාණ්ඩය වන්නේ,
(1) තිරුඅම්මානෛ, තිරුවුන්දියාර් හා තිරුච්චාළල් ය.
(2) තිරුප්පල්ලාණ්ඩු, අන්නෛප්පත්තු හා සිවපුරාණම් ය.
(3) සිවපුරාණම්, තිරුවෙම්පාවෛ හා තිරුව්සෛප්පා ය.
(4) තිරුවුන්දියාර්, තිරුත්තෙල්ළේණම් හා තිරුප්පල්ලාණ්ඩු ය.

**22.** පංචාංගවලට ඇතුළත් අංග පමණක් දැක්වෙන වරණය කුමක් ද?
(1) පරණි, චන්ද්‍රන්, යෝගම් (2) කරණම්, නඩ්චත්තිරම්, වාරම්
(3) තිදි, හේදු, පුදන් (4) වාරම්, තිදි, සූරියන්

**23.** ආඩහසෞන්දරී යන රජිනගේ ආබාධය ඉවත් වූ ස්ථානය වන්නේ,
(1) කීරිමලෛ ය. (2) තිරුක්කේදීච්චරම් ය.
(3) මාමාංගේස්වරම් ය. (4) කොක්කට්ටිච්චෝලෛ තාන්තෝන්රීච්චරම් ය.

**24.** සම්බන්දර් සහ අප්පර්තුමන්ලාට තමන්ගේ නිවසට කැඳවා සංග්‍රහ කිරීමේ අවස්ථාව ලැබූ නායනාර් වන්නේ,
(1) සුන්දරමූර්ති නායනාර් ය. (2) අප්පූදියඩිහල් ය.
(3) සෙක්කිළාර් ය. (4) කුන්ගුලියක්කලය නායනාර් ය.

**25.** ආර්ය අධිරාජ්‍යයන්ගේ කාලයේ සිංගෛ නගරම් යැයි හඳුන්වන ලද්දේ,
(1) කෝණමලෛ ය. (2) මාදෝට්ටම් ය.
(3) වල්ලිපුරම් ය. (4) පූනහරි ය.

**26.** 'නිර්විහාරි' ලෙස දෙවියන් හැඳින්වීමෙහි අර්ථය කුමක් ද?
(1) දෙවියන් කිසිඳු විකෘතියකට පත්වන්නේ නැත. (2) දෙවියන් ගුණාංග තුනම ඇති අයෙක් ය.
(3) දෙවියන් වහන්සේ සියල්ල දන්නා අයෙකි. (4) දෙවියන් වහන්සේ සර්වබලධාරී ය.

**27.** සෞරමානම් යන්නෙන් අදහස් වන්නේ,
(1) තරු යන්නයි. (2) චන්ද්‍රමානම් යන්නයි.
(3) සූරියමානම් යන්නයි. (4) පංචාංග ගණනය කිරීම යන්නයි.

**28.** යහපත් ගුණය (ඔප්පුරවු) යනු
(1) තමාටම සම්බන්ධ අය සමග සම්බන්ධවීම ය.
(2) අපගේ යුතුකම් නොවරදවා ඉටු කිරීම ය.
(3) සත්‍ය කතා කරමින් ජීවත් වීම ය.
(4) මිනිසුන්ට උදව් කරමින් ජීවත් වීම ය.

**29.** අනුමාන ප්‍රමාණම් මගින් ලබා ගන්නා දැනුම යනු
(1) පංච ඉන්ද්‍රියන් මගින් සෘජුව ම ලබා ගන්නා දේ ය.
(2) සමපේක්ෂණය හරහා වටහා ගැනීම ය.
(3) ග්‍රන්ථ මගින් දැන ගැනීම ය.
(4) ඥානවන්තයන් විසින් පවසන දේ ය.

**30.** ශ්‍රී ලංකාව නාගතීවු යනුවෙන් නම් දැරීමට හේතුව වන්නේ,
(1) පුරාතන ශ්‍රී ලංකාවේ නාගවරුන්ගේ ආභාෂය වැඩි වී තිබීම නිසා ය.
(2) ශ්‍රී ලංකාවේ නාග වන්දනාව සඳහා දේවාල දක්නට ලැබීම නිසා ය.
(3) නාගතම්බිරාන් දේවාල පිළිබඳ මිත්‍යා මත පැවතුනු නිසා ය.
(4) නාගමණිගල් අධිකව ලැබෙන නිසා ය.

**31.** දන් දීම යනු
(1) කෙනෙකුගේ පැවැත්මට අත්‍යවශ්‍ය දෙයක් ලබාදීම වේ.
(2) කිසිඳු ප්‍රතිලාභයක් අපේක්ෂා නොකර සතුටින් යමක් දීම ය.
(3) කරන ලද අනුග්‍රහය ප්‍රතිනිර්මාණය කිරීම ය.
(4) ශිව බැතිමතුන්ට ආහාර ලබා දීම ය.

**32.** ආශිර්වාදය යනු
(1) ජීවීන්ට තනු, කරණ, පුවන හා පෝහංගල් යනාදිය ලබා දීම ය.
(2) නිර්මාණය කරන ලද දේ පැවතිය යුතු කාලය දක්වා ආරක්ෂා කිරීම ය.
(3) ආත්මයන් අල්ලාගෙන සිටින මළ වැළැක්වීම ය.
(4) ආත්මයන්ගේ මළ බැඳීම් ඉවත් කර ඔවුනට උපරිම සතුට ලබා දීම ය.

**33.** සුන්දරර් තුමා "මීළා අඩිමෛ උමක්කේ ආළාය්"යන ගීතිකාව ගායනා කරන ලද අවස්ථාව වන්නේ,
(1) සේරමාන් පෙරුමාළ් සමග කයිලාශ් වන්දනාවේ ගිය විට ය.
(2) ගඟට දැමූ රත්තරන් පොකුණෙන් ලබා ගැනීමට තැත් කළ විට ය.
(3) දකුණු ඇසේ දෘෂ්ටිය යථා තත්ත්වයට පත් කර දෙන ලෙස ඉල්ලූ විට ය.
(4) මෝක්ෂය ලබා දෙන ලෙස දෙවියන් වහන්සේගෙන් ඉල්ලූ විට ය.

**34.** "සිත්තමුම් සෙල්ලා සේවසියන්" යැයි ශිව දෙවියන්ව ප්‍රශංසා කළ පුද්ගලයා වන්නේ,
(1) තිරුඥානසම්බන්දර් ය. (2) තිරුනාවුක්කරසර් ය.
(3) සුන්දරර් ය. (4) මාණික්කවාසගර් ය.

**35.** "ඉරෛවන් උවක්කුම් ඉන්මැලර්හල්" (දෙවියන් කැමතිවන හොඳ මල්) ලෙස සුවාමි විපුලානන්දර් පවසන ලද්දේ,
(1) පංච ඉන්ද්‍රියන් මර්දනය කිරීම, කරුණාව හා තපස ය.
(2) හදවත යන නෙළුම් මල, නැමුණු දෑත් යන නියගලා මල හා ඇස යන නිල් මානෙල් මල ය.
(3) යුතුකම පිළිබඳ හැඟීම, සමාජය පිළිබඳ හැඟීම හා දහම් පිළිබඳ හැඟීම ය.
(4) වතුසුදු මල්, රතු වද මල් හා රෝස මල් ය.

**36.** නිරාදර තීක්ෂාව යනු
(1) සහලර් සහ ප්‍රළයාහලර්ට අයත් එකකි.
(2) සහලර් සහ විඥ්ඥානහලර්ට අයත් එකකි.
(3) ප්‍රළයාහලර් සහ විඥ්ඥානහලර්ට අයත් එකකි.
(4) සහලර්, විඥ්ඥානහලර් සහ ප්‍රළයාහලර්ට අයත් එකකි.

**37.** "නීරු ඉල්ලා නෙට්රි පාළ්" යැයි තිරුනීරුවල වැදගත්කම තේරුම් කර දුන්නේ,
(1) තිරුඥානසම්බන්දර් ය. (2) තිරුවල්ලුවර් ය.
(3) සේක්කිළාර් ය. (4) ඖවෛයාර් ය.

- පහත සඳහන් වගුවේ A සිට I දක්වා දී ඇති තොරතුරු ආශ්‍රයෙන් **38** සිට **40** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරන්න.

| ශෛව පෞරුෂය | සම්බන්ධ ආයතන | අධ්‍යාපනික සේවය |
|---|---|---|
| A – ශ්‍රීලශ්‍රී ආරුමුග නාවළර් | D – සෛව විත්‍යාවිරුත්තිච් සංගම් | G – සිවානන්ද විද්‍යාලයම් |
| B – ඉන්දු පෝට් ඉරාසරත්තිනම් | E – ඉරාමක්‍රිෂ්ණ මිෂන් | H – සෛවාසිරිය කලාසාලෛ |
| C – ස්වාමි විපුලානන්දර් | F – සෛව පරිපාලන සබෛ | I – සෛවප්‍රකාස විත්‍යාසාලෛ |

**38.** විසිවන සියවසේ ඉපදුණු ශෛව ප්‍රතිසංස්කරණවාදියා හා සම්බන්ධ කාණ්ඩය වන්නේ,
(1) AFI ය. (2) BDH ය. (3) BEH ය. (4) CEG ය.

**39.** ශෛව සිද්ධාන්ත මහාසමාජය හා සමීපව සම්බන්ධවන පෞරුෂයට සම්බන්ධ කාණ්ඩය වන්නේ,
(1) AEG ය. (2) AEI ය. (3) CDI ය. (4) CEG ය.

**40.** විත්තියානුපාලන මුද්‍රණාලය පිහිට වූ ශෛව පෞරුෂය හා සම්බන්ධ කාණ්ඩය වන්නේ,
(1) AFH ය. (2) AFI ය. (3) BDI ය. (4) BFH ය.

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

12 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)

| | |
|---|---|
| ශෛවනෙරි | I, II |
| சைவநெறி | I, II |
| Saivanery | I, II |

## ශෛවනෙරි II

* **පළමුවන** ප්‍රශ්නය හා **දෙවන** ප්‍රශ්නය ඇතුළුව, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* පළමුවන ප්‍රශ්නයට ලකුණු **20** ක් ද, දෙවන ප්‍රශ්නය ඇතුළු අනෙකුත් සෑම ප්‍රශ්නයක් සඳහා ම ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) වේද හඳුන්වනු ලබන වෙනත් නම් **දෙකක්** සඳහන් කරන්න.

(ii) දීපාවලී යන වචනයේ අර්ථය සඳහන් කරන්න.

(iii) අරුණගිරිනාදර් විසින් අගය කරනු ලැබූ ශ්‍රී ලංකාවේ පූජනීය ස්ථාන **දෙකක්** සඳහන් කරන්න.

(iv) ශිව බැතිමතුන්ට ආහාර දන් දීමේ සේවය කළ අය ලෙස පෙරියපුරාණම්හි සඳහන් කරනු ලබන පිරිමි බැතිමතුන් **දෙදෙනෙකුගේ** නම් සඳහන් කරන්න.

(v) සුවාමි විපුලානන්දර් විසින් රචනා කරන ලද ග්‍රන්ථ **දෙකක්** නම් කරන්න.

(vi) දේවාලවල පවත්වන සිත්ත්‍රා පෞර්ණමී විශේෂ වන්දනාවලදී සිදුවන ප්‍රධාන සිදුවීම් **දෙකක්** සඳහන් කරන්න.

(vii) "පිං කිරීමට මහ ධනය අවශ්‍ය නොවේ, සරල ක්‍රමවේද ප්‍රමාණවත් වේ" යන්නට තිරුමූලර් සඳහන් කරන උදාහරණ **දෙකක්** ලියන්න.

(viii) පොළොන්නරුව යුගයට අයත් සිංහල රජවරුන් විසින් පිහිටුවන ලද ශිව දේවාල **දෙකක්** නම් කරන්න.

(ix) උමාපති සිවාචාරියාර් සිදු කළ ආශ්චර්යයන් **දෙකක්** සඳහන් කරන්න.

(x) පෙරියපුරාණ කාව්‍යයේ තිරුක්කුට්ට විශේෂත්වයේ දැක්වෙන "කේඩුම් ආක්කමුම් කෙට්ට තිරුවිනාර්" යන ගීත පදයේ තේරුම කුමක් ද?

**2.** (i) පහත සඳහන් ගීතිකා අතුරෙන් **දෙකක්** නිවැරදිව හා නියමිත අනුපිළිවෙළට ලියන්න.

(අ) "කුනිත්ත පුරුවමුම්..."

(ආ) "පාල් නිනෛන්දූට්ටුම්..."

(ඉ) "විනායහනේ වෙව්විනෛයෛ..."

(ඊ) "මූව්රු මුහංගල්..."

(උ) "තනම් තරුම් කැල්වි තරුම්..."

(ii) ඉහත (i) හි ලියන ලද ගීතිකාවල අදහස ලියන්න.

**3.** "ඉන්බමේ එන්නාලුම් දුන්බමිල්ලෛ"

– තිරුනාවුක්කරසර් –

(i) දන් දීම, සමානත්වය යන ශෛව සදාචාර දහම් ගුණාංග සමඟ පිළිවෙළින් සම්බන්ධ වන ආකාරයට තිරුනාවුක්කරසර්ගේ ආශ්චර්යයන් **දෙකක්** ලියන්න.

(ii) තිරුනාවුක්කරසර්තුමාට ජෛන ආගමිකයන් සිදු කළ කෲර ක්‍රියා **තුනක්** හා ඒවායින් මිදීමට ඔහු විසින් ගායනා කරන ලද ගීතිකා (පදිහංගල්) **තුනක්** සඳහන් කරන්න (පදිහම්වල මුල් පද පේළි පමණක්).

(iii) තිරුනාවුක්කරසර්තුමාගේ ජීවිතයේ සිදුවූ 'කෛලාස තරිසනම්' පිළිබඳ තොරතුරු කෙටියෙන් පැහැදිලි කරන්න.

[ හයවැනි පිටුව බලන්න.

**4.** "කුණංගර් ඊණ්ඩිය කළත්තිංඩෙ තණුහියේ කුමරන් තාළ්
වණංගි මුම්මුරෛ පුහළ්න්දනර්"

– කන්දපුරාණම් මීට්සිප්පඩලම් –

(i) මීට්සිප්පඩලම් යන නම ඇතිවීමට හේතුව කෙටියෙන් සඳහන් කරන්න.

(ii) කන්දපුරාණම්වල එන කාණ්ඩම් අතුරෙන් **තුනක්** නම් කරන්න.

(iii) මුරුග දෙවියන්ගේ උපවාස අතුරෙන් **එකක්** පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

**5.** "තන්නිලමෛ මන්නුයිර්හල් සාරත් තරුම් ශක්ති
පින්නමිලාත් එංගල් පිරාන්"

– තිරුවරුට්පයන් –

(i) පතිගේ තිබෙන ආකාර **දෙක** කුමක් ද?

(ii) පති වෙත ළඟා වීමට ආත්මයන්හට ඉඩ නොදෙන අහංකාරයේ ගුණාංග (ආනවම්) **තුනක්** සඳහන් කරන්න.

(iii) ආත්ම විමුක්තිය සඳහා වූ ක්‍රමවේද ලෙස සෛවසිද්ධාන්තම්හි සඳහන් වන සෛවනාට්පාදංගල් පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

**6.** "ශ්‍රී ලංකාවේ ජන ආගමික සම්ප්‍රදායේ පිරිමි සහ ගැහැණු දෙවිවරුන් අද්විතීය චාරිත්‍ර අනුගමනය කරමින් වන්දනාමාන කරනු ලැබේ."

(i) ජන වන්දනා සම්ප්‍රදායේ දක්නට ලැබෙන පුරුෂ දෙවිවරුන් **දෙදෙනෙකු** නම් කරන්න.

(ii) ජන ආගමික සම්ප්‍රදායේ පරාශක්තිගේ ලක්ෂණයක් ලෙස කණ්ණහිව නිරූපණය කරන ශ්‍රී ලංකාවේ සාහිත්‍යයන් **තුනක්** සඳහන් කරන්න.

(iii) කණ්ණහි මෑණියන්ට අයත් චාරිත්‍රවල දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න.

**7.** පහත සඳහන් මාතෘකාවලින් **දෙකක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) විවාහ චාරිත්‍ර

(ii) තිරුකේද්ීච්චරම්

(iii) ශෛව ආගමික ජීවිතය

(iv) උත්සවය (මහෝත්සවම්)

* * *